**Grade 11 - First Term Test – June 2021**

කාලය : පැය තුනයි
Time: Three hours

**පළමු වාර පරීක්ෂණය – 2021 - ජුනි - 11 ශ්‍රේණිය**

**Business and Accounting Studies – I, II**

**ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I, II**

| 60 | S | I,II |
|---|---|---|

Name: - ................................................................ class: -.................. Index no: - ..........................

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - 1

- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (X) ලකුණ යොදන්න.

- පහත සඳහන් සිද්ධිය කෙරෙහි අවධානය යොමු කරමින් අංක **1** සිට **4** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

උපේකා, මැහුම් පාඨමාලාවක් හැදෑරීමෙන් පසුව, තම නිවසේ ම කාන්තාවන්ට හා කුඩා ළමුන්ට සුදුසු නිමි ඇඳුම් නිෂ්පාදන ආයතනයක් "විලාසිතා" නමින් ආරම්භ කරන ලදි. ආරම්භයේ දී තම නිෂ්පාදිත ඇය විසින් ම අවට වෙළෙඳසල් වෙත සැපයූ අතර අද වන විට ආසන්න නගරයේ වෙළෙඳසල්වලින් ද ඇණවුම් ලැබෙමින් පවතී. මේ තත්ත්වය යටතේ මැහුම් කටයුතු සඳහා පළපුරුදු සේවිකාවන් දෙදෙනෙකු ද බඳවා ගෙන ඇත.

1. උපේකාගේ ව්‍යාපාර ආයතනයෙන් ඉටුවන මිනිස් අවශ්‍යතාව වන්නේ,
   (1) කාන්තා ගවුම් ය (2) ළමා කලිසම් ය
   (3) ඇඳුම් ය (4) වාසස්ථාන ය

2. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිතයේ ස්වභාවය අනුව උපේකාගේ ව්‍යාපාරය,
   (1) හවුල් ව්‍යාපාරයක් වේ.
   (2) සේවා සපයන ව්‍යාපාරයක් වේ.
   (3) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් වේ.
   (4) ලාභ අරමුණු කරගත් ව්‍යාපාරයක් වේ.

3. උපේකාගේ ව්‍යාපාරයට ව්‍යාපාරික අවස්ථාවක් වන්නේ,
   (1) සහායට සේවිකාවන් සිටීම ය (2) මැහුම් පාඨමාලාවක් හදාරා තිබීම ය
   (3) අවට වෙළෙඳ සල් පැවතීම ය (4) ආසන්න නගරයේ වෙළෙඳ සල්වලින් ද ඇණවුම් ලැබීම ය

4. ඉහත සිද්ධියට අදාළ නිවැරදි ප්‍රකාශය වන්නේ,
   (1) මෙම සිද්ධියට අදාළ ව්‍යාපාර නාමය ලියාපදිංචි විය යුතු ය.
   (2) උපේකාට ඇඳුම් මැසීම පිළිබඳ දක්ෂතාවක් නොමැති වීම ය.
   (3) ඇගේ නිමි ඇඳුම් වලට ඇති ඉල්ලුම ක්‍රමයෙන් අඩු වීම ය.
   (4) ව්‍යාපාරය දියුණු කිරීමට බාධා ඇති බව ය.

5. අයිතිකරුවන් සියලු දෙනාගේ සහභාගිත්වයෙන් කළමනාකරණය කිරීමට වඩා සුදුසු ව්‍යාපාර සංවිධාන වර්ගය වන්නේ,
   (1) ඒක පුද්ගල ව්‍යාපාර ය (2) හවුල් ව්‍යාපාර ය
   (3) සංස්ථාපිත සමාගම් ය (4) සමිති සංවිධාන ය

6. ව්‍යාපාර කෙරෙහි සැපයුම්කරුවන් ඇල්මක් දක්වන්නේ,
   (1) ප්‍රමාණවත් ලාභයක් ලබා ගැනීමට ය (2) තම නිෂ්පාදිත වල මිල තීරණය කිරීමට ය
   (3) නිවැරදි කළමනාකරණ තීරණ ගැනීමට ය (4) අඛණ්ඩ ව ඇණවුම් ලබා ගැනීමට ය.

7. ව්‍යාපාරයක බාහිර පරිසර සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) ගනුදෙනුකරුවෝ, සේවකයෝ, තරගකරුවෝ

(2) අයිතිකරුවෝ, සේවකයෝ, කළමනාකරුවෝ

(3) අයිතිකරුවෝ, සේවකයෝ, තරගකරුවෝ

(4) ගනුදෙනුකරුවෝ, සැපයුම්කරුවෝ, තරගකරුවෝ

8. හවුල් ව්‍යාපාරයක උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව තීරණය කරන පනත වන්නේ,

(1) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

(2) 1840 අංක 7 දරන වංචා වැළැක්වීමේ ආඥා පනත

(3) 1918 අංක 6 දරන නාම ව්‍යාපාර ආඥා පනත

(4) 2007 අංක 7 දරන සමාගම් පනත

9. පහත X කාණ්ඩය, Y කාණ්ඩය සමඟ නිවැරදිව ගැළපූ විට,

| X කාණ්ඩය | Y කාණ්ඩය |
|---|---|
| 1. නැවත විකිණීම සඳහා භාණ්ඩ අලෙවි කිරීම | A. ආනයන වෙළෙඳාම |
| 2. තේ තොගයක් ඇමරිකාවට විකිණීම | B. තොග වෙළෙඳාම |
| 3.අවසාන පරිභෝජනය සඳහා භාණ්ඩ විකිණීම | C. අපනයන වෙළදාම |
| 4. ඉන්දියාවෙන් පරිප්පු තොගයක් මිලට ගැනීම | D. සිල්ලර වෙළදාම |

(1) BCAD (2) CBAD (3) BCDA (4) CBDA

10. ව්‍යාපාරිකයන්ට තම ගනුදෙනු පහසු කර ගැනීම සඳහා වාණිජ බැංකුවක ඇරඹිය හැකි වඩාත් සුදුසු ම ගිණුම් වර්ගය වන්නේ,

(1) ජංගම ගිණුම්

(2) ධනයෝජන ඉතිරි කිරීමේ ගිණුම්

(3) ඉතිරි කිරීමේ ගිණුම්

(4) ස්ථාවර තැන්පතු ගිණුම්

11. චෙක්පතක පහතින් ඇති චුම්බක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ (MICR) අංක කාණ්ඩ හතර පිළිවෙළින් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) බැංකුවේ අංකය, චෙක්පතේ අංකය, බැංකු ශාඛාවේ අංකය, බැංකු ගිණුමේ අංකය

(2) චෙක්පතේ අංකය, බැංකුවේ අංකය, බැංකු ශාඛාවේ අංකය, බැංකු ගිණුම් අංකය

(3) චෙක්පතේ අංකය, බැංකු ශාඛාවේ අංකය, බැංකුවේ අංකය, බැංකු ගිණුම් අංකය

(4) බැංකු ගිණුම් අංකය, චෙක් පතේ අංකය, බැංකුවේ අංක, බැංකු ශාඛාවේ අංකය

12. චතුරට අයිති ලොරි රථයට රු. 2 000 000ක සම්පූර්ණ වගකීම සහිත රක්ෂණ ඔප්පුවක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් ලබාගෙන තිබූ අතර, එම රථය පාරේ ගමන් කිරීමේ දී සිදු වූ අනතුරකින් රු. 500 000 හානියක් සිදු විය. එම හානිය සඳහා ලබාගත හැකි උපරිම වන්දි මුදල

(1) රු. 500 000

(2) රු. 1 500 000

(3) රු. 2 000 000

(4) රු. 2 500 000

13. මධ්‍යම පරිසර අධිකාරිය විසින් පවත්වන ලද දේශනයකට සවන් දී, ස්වභාවික ආපදා පිළිබඳ දැනුවත් වී සිටි අංජන, යළිත් ඒ ගැන හැදෑරුවේ රූපවාහිනී අධ්‍යාපන වැඩසටහනක් මගිනි. තවද දිනමිණ පුවත්පතේ පළ වූ අදාළ ලිපිය ද ඔහුට භාවිතා කරන්නට සිදු වුණි. අංජන ඉගෙනීම සඳහා යොදා ගත් සන්නිවේදන මාධ්‍යයන් පිළිවෙළින් පෙළ ගැස්විය යුත්තේ,

(1) විද්‍යුත්, ලිඛිත, වාචික වශයෙනි.

(2) විද්‍යුත්, වාචික, ලිඛිත වශයෙනි.

(3) වාචික, විද්‍යුත්, ලිඛිත වශයෙනි.

(4) වාචික, ලිඛිත, විද්‍යුත් වශයෙනි.

14. ප්‍රවාහනයේ මූලිකාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මාර්ගය, බලය, මෝටර් රථ, ගුවන් යානා

(2) මාර්ගය, මාධ්‍යය, බලය, පර්යන්තය

(3) මාධ්‍යය, නැව, වරාය, බලය

(4) බලය, පර්යන්තය, බස්රිය, දුම්රිය

15. සිසිල් බීම නිෂ්පාදන ආයතනයකට නිෂ්පාදන කටයුතු හා අලෙවි කටයුතු සඳහා අදාළ කළමනාකරුවන් පත්කර ගැනීම යන්න කළමනාකරණ ක්‍රියාවලියට අයත් කාර්යයක් ලෙස දැක්විය හැක්කේ,

(1) සැලසුම්කරණය

(2) සංවිධානකරණය

(3) මෙහෙයවීම

(4) පාලනය ලෙස ය.

16. "ශ්‍රී ලංකාවේ ප්‍රසිද්ධ පාවහන් නිෂ්පාදන ආයතනයක් අනුග්‍රහයෙන් 2021 ජාතික වොලිබෝල් ක්‍රීඩා තරගාවලිය පැවැත්වීමට තීරණය කර ඇත". මෙම ප්‍රකාශය ප්‍රවර්ධන මිශ්‍රයේ කුමන විචල්‍යයකට අයත් වේ ද?

(1) ප්‍රචාරණය (2) පෞද්ගලික අලෙවිය
(3) මහජන සම්බන්ධතා (4) විකුණුම් ප්‍රවර්ධනය

.

17. ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,

(1) ව්‍යාපාරය උපයාගත් ලාභය දැනගැනීම (2) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය දැනගැනීම
(3) ඇල්මැති පාර්ශවයන්ට විවිධ තොරතුරු සැපයීම (4) නීතිමය අවශ්‍යතා ඉටු කර දීම

18. ව්‍යාපාරයක ගනුදෙනුවක් සටහන් කිරීමට අදාළ ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

| වත්කම් (රු.) | = | හිමිකම් (රු.) | + | වගකීම් (රු.) |
|---|---|---|---|---|
| + 5 000 | | | | + 5 000 |

ඉහත ගිණුම්කරණ සමීකරණයේ සටහන් කර ඇති ගනුදෙනුව වන්නේ,

(1) සමන්ට රු. 5 000ක බඩු තොගයක් ණයට විකිණීම
(2) රු. 5 000ක කඩ කුලී ආදායමක් ලැබීම
(3) අයිතිකරු රු. 5 000ක අතිරේක ප්‍රාග්ධනය යෙදවීම
(4) කැලුම්ගෙන් රු. 5 000ක බඩු තොගයක් ණයට ගැනීම

19. පහත ගනුදෙනු අතරින් හිමිකම වැඩි වීමට බලපාන ගනුදෙනුව වන්නේ,

(1) රු. 3 000ක විදුලි ගාස්තු මුදලින් ගෙවීම
(2) රු. 2 000ක බැංකු ණය පොලී ගෙවීම
(3) අයිතිකරු විසින් රු. 7 000ක් ණයහිමියන්ට ගෙවීම
(4) රු. 8 000ක ලී බඩු උපකරණ මිලට ගැනීම

20. ණයහිමියෙකුට නිකුත් කළ රු. 4 000ක චෙක්පත අගරු වීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(1) ණයහිමි ගිණුම හර රු. 4 000
බැංකු ගිණුම බැර රු. 4 000

(2) බැංකු ගිණුම හර රු. 4 000
ණයහිමි ගිණුම බැර රු. 4 000

(3) මුදල් පොත හර රු. 4 000
ණයහිමි ගිණුම බැර රු. 4 000

(4) ණයහිමි ගිණුම හර රු. 4 000
මුදල් පොත බැර රු. 4 000

21. පහත X තීරුවේ ගිණුම් වර්ග ද, Y තීරුවේ එම ගිණුම් වර්ග වලට අදාළ නිදසුන් ද පහත දැක්වේ.

| | X තීරුව | | Y තීරුව |
|---|---|---|---|
| 1. | වත්කම් ගිණුම | A. | ගැනිලි |
| 2. | වියදම් ගිණුම | B. | බැංකු ණය |
| 3. | හිමිකම් ගිණුම | C. | මෝටර් රථ |
| 4. | ආදායම් ගිණුම | D. | ලද වට්ටම් |
| 5. | වගකීම් ගිණුම | E. | විදුලි ගාස්තු |

X තීරුවට පිළිවෙළින් නිවැරදිව ගැළපූ විට

(1) CEADB (2) BAECD (3) ABCDE (4) ECADB

22. "වැඩිවීම හර අඩුවීම බැර" යන ද්විත්ව සටහන් මූලධර්මය නිරූපණය වන ගිණුම වන්නේ,

(1) ලද වට්ටම් ගිණුම (2) ප්‍රාග්ධන ගිණුම
(3) ණයහිමි ගිණුම (4) ණයගැති ගිණුම

23. ශක්ති ලී බඩු වෙළෙඳසැලට යමුනා මෝටර්ස් ආයතනයෙන් රු.ලක්ෂ 15ක ලොරි රථය ණයට ගැනීමට අදාළ මූලාශ්‍ර ලේඛනය (1).................. වන අතර මූලික සටහන් පොත (2)..................වේ. (1) හා (2) යන ස්ථාන සඳහා නිවැරදි පිළිතුර පිළිවෙළින් දැක්වෙන්නේ,

(1) ගැනුම් ඉන්වොයිසිය, ගැනුම් ජ'නලය (2) ගැනුම් ජ'නලය, ගැනුම් ඉන්වොයිසිය
(3) පොදු ජ'නලය, ජ'නල් වවුචරය (4) ජ'නල් වවුචරය, පොදු ජ'නලය

24. ව්‍යාපාරයක 2021.01.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය රු. 20 000ක් වූ අතර එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු. 22 000ක් විය. මෙම වෙනසට හේතු වන ගනුදෙනුව වන්නේ,

(1) ස්ථාවර නියෝග මත බැංකුව අයකරගත් රු. 2 000ක රක්ෂණ වාරිකය
(2) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 2 000
(3) බැංකුවට සෘජුව ම ලැබී තිබූ ලාභාංශය රු. 2 000
(4) බැංකුව විසින් අයකරගත් රු. 2 000ක බැංකු ගාස්තු

25. කැලුම් ගේ ව්‍යාපාරයෙහි ණයගැතියෙකු වූ නෙළුම්ගෙන් රු. 8 000ක ණය මුදලක් ලැබීමේදී 10% ක වට්ටමක් දෙන ලදී. මෙය කැලුම්ගේ ව්‍යාපාරයේ,

(1) රු. 8 000ක ලද වට්ටමකි. (2) රු. 800ක දුන් වට්ටමකි.
(3) රු. 8 000ක දුන් වට්ටමකි. (4) රු. 800ක ලද වට්ටමකි.

26. සුනිත ගේ වෙළෙඳ ව්‍යාපාරයෙහි සුළු මුදල් අග්‍රිමය රු. 4 000ක් විය. 2021.01.31 දින සුළු මුදල් භාරකරු සතුව රු. 300ක් තිබුණු අතර, පෙබරවාරි මාසයේ සිට සුළු මුදල් අග්‍රිමය රු. 500කින් වැඩි කිරීමට තීරණය කරන ලදී. මෙම ව්‍යාපාරයේ 2021.02.01 දින ප්‍රතිපූර්ණය කරන ලද මුදල වන්නේ,

(1) රු. 3 700 (2) රු. 4 000 (3) රු. 4 200 (4) රු. 4 500

27. සළුපිලි වෙළෙඳසල විසින් පිළියෙළ කළ මූලික සටහන් පොතක, දිනය, ඉන්වොයිස් අංකය, සැපයුම්කරු, මුළු වටිනාකම හා ලෙජර් පිටුව යන තීරු දක්නට ලැබුණි. මෙම මූලික සටහන් පොත වන්නේ,

(1) විකුනුම් ජ'නලය (2) ගැනුම් ජ'නලය
(3) සුළු මුදල් පොත (4) පොදු ජ'නලය

28. පහත සඳහන් වන්නේ ව්‍යාපාරයක් විසින් පිළියෙල කරන ලද මූලික සටහන් පොත් වේ.

A. මුදල් පොත
B. ගැනුම් ජ'නලය
C. බැංකු ගිණුම
D. විකුණුම් ජ'නලය
E. සුළු මුදල් පොත

මෙම මූලික සටහන් පොත් අතරින් ලෙජර් ගිණුමක කාර්යය ඉටු කරන මූලික සටහන් පොත් ඇතුළත් පිළිතුර වන්නේ,

(1) ACE (2) ABC (3) ADE (4) ACD

29. ගනුදෙනුකරුවෙකුට දුරකථන බැංකු සේවාව මගින් ඉටු කරගත හැකි සේවාවක් **නොවන්නේ**,

(1) විදුලි බිල්පත්, ජල බිල්පත් ආදිය ගෙවීමට හැකිවීම.
(2) බැංකු ගිණුමේ ශේෂය පරික්ෂා කිරීමට හැකිවීම.
(3) චෙක් පොතක් ගෙන්වා ගත හැකි වීම.
(4) ගිණුමකින් තවත් ගිණුමකට මුදල් මාරු කිරීම කළ හැකි වීම.

30. ගිණුම්කරණ ක්‍රියාදාමයක නිවැරදි පිළිවෙළ වන්නේ,

(1) ගනුදෙනු → මූලාශ්‍ර ලේඛන → මූලික පොත් → ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම → මූල්‍ය ප්‍රකාශන

(2) මූලාශ්‍ර ලේඛන → ගනුදෙනු → මූලික පොත් → ලෙජර් ගිණුම් → ශේෂ පිරික්සුම → මූල්‍ය ප්‍රකාශන

(3) මූලාශ්‍ර ලේඛන → ගනුදෙනු → ලෙජර් ගිණුම් → මූලික පොත් → ශේෂ පිරික්සුම → මූල්‍ය ප්‍රකාශන

(4) ගනුදෙනු → මූලාශ්‍ර ලේඛන → ලෙජර් ගිණුම් → මූලික පොත් → ශේෂ පිරික්සුම → මූල්‍ය ප්‍රකාශන

31. මිහිර ස්ටෝර්ස් 2021.01.04 දින පිළිවෙළින් භාවිතා කර තිබුණේ පහත සඳහන් මූලාශ්‍ර ලේඛනයන් ය.
ලදුපත, ගෙවීම් වවුචරය, ජර්නල් වවුචරය
එදින සිදු වූ ගනුදෙනුවල පිළිවෙළ වන්නේ,

(1) අත්පිට විකුණුම්, ස්ථාවර වත්කම් ණයට ගැනුම්, කම්කරු කුලී ගෙවීම්

(2) ණයට විකුණුම්, ස්ථාවර වත්කම් ණයට ගැනුම්, කම්කරු කුලී ගෙවීම්

(3) ණයහිමියන්ට ගෙවීම්, අත්පිට ගැනුම්, කම්කරු කුලී ගෙවීම්

(4) අත්පිට විකුණුම්, සේවක වැටුප් ගෙවීම්, ස්ථාවර වත්කම් ණයට ගැනුම්

32. පහත ප්‍රකාශ අතරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ව්‍යාපාරයක ප්‍රාග්ධන ගිණුම, වගකීම් ගිණුමකට නිදසුනකි.

(2) ව්‍යාපාරයක් විසින් පිළියෙල කොට තිබූ බැංකු ගිණුමේ වූ බැර ශේෂය වාසිදායක ශේෂයකි.

(3) මුදල් ගිණුම මූලික පොතක් මෙන් ම ලෙජර් ගිණුමක් ලෙස ද ක්‍රියා කරයි.

(4) වැඩි වීම් හර හා අඩුවීම් බැර යන ද්විත්ව සටහන් රීතිය ක්‍රියාත්මක වන්නේ වත්කම් ගිණුම් හා ආදායම් ගිණුම් සම්බන්ධයෙනි.

33.

| | ගිණුමේ නම | ශේෂය හර රු. | ශේෂය බැර රු. |
|---|---|---|---|
| 1. | පියල්ගේ ගිණුම | 1 000 | - |
| 2. | ජනිතාගේ ගිණුම | - | 3 000 |
| 3. | විකුණුම් ගිණුම | - | 5 000 |
| 4. | වැටුප් ගිණුම | 1 200 | - |

ඉහත ගිණුම් 04, පිළිවෙළින් නිවැරදි ගිණුම් වර්ගීකරණයකට හසු කර ඇති පිළිතුර වන්නේ,

(1) වත්කම්, වගකීම්, අදායම්, වියදම්

(2) වගකීම්, වත්කම්, ආදායම්, වියදම්

(3) වත්කම්, වගකීම්, වියදම්, ආදායම්

(4) වගකීම්, වත්කම්, වියදම්, ආදායම්

34. ණයගැතියෙකුගෙන් ලැබුණු රු. 7 000ක චෙක් පතට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(1) මුදල් ගිණුම හර රු. 7 000
ණයගැති ගිණුම බැර රු. 7 000

(2) ණයගැති ගිණුම හර රු. 7 000
මුදල් ගිණුම බැර රු. 7 000

(3) බැංකු ගිණුම හර රු. 7 000
ණයගැති ගිණුම බැර රු. 7 000

(4) ණයගැති ගිණුම හර රු. 7 000
බැංකු ගිණුම බැර රු. 7 000

35. ශාන්ති හාඩ්වෙයාර් හි 2020 ජනවාරි මාසයේ ගැනුම් ජර්නලය එකතුව රු. 4 800ක් විය. මෙය ලෙජරයට පිටපත් කිරීමට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ,

(1) ගැනුම් ගිණුම හර රු. 4 800
මුදල් ගිණුම බැර රු. 4 800

(2) ගැනුම් ගිණුම හර රු. 4 800
බැංකු ගිණුම බැර රු. 4 800

(3) ගැනුම් ගිණුම හර රු. 4 800
ණයහිමි ගිණුම බැර රු. 4 800

(4) ණයගැති ගිණුම් හර රු. 4 800
ගැනුම් ගිණුම බැර රු. 4 800

36. පරිගණක ආශ්‍රිත ගිණුම්කරණය නිසා,

(1) කාලය ඉතිරි වේ.

(2) පිරිවැය පහළ බසී.

(3) නිරවද්‍යතාවය ඉහළ යයි.

(4) ඉහත සියල්ල සිදුවේ.

37. සුගන්ධි හඳුන්කූරු සමාගම 2020 දෙසැම්බර් මස රු.30 බැගින් වූ හඳුන්කූරු පැකට් 1 000ක් විකුණා තිබූ අතර 10% වට්ටමක් ඒ සඳහා ලබා දී තිබුණි. සියලු විකුණුම් ණයට වන අතර ණය ගැතියන්ගෙන් රු. 25 000ක මුදලක් ලැබුණි. මෙම ව්‍යාපාරයේ විකුණුම් වටිනාකම වන්නේ,

(1) රු. 22 500 (2) රු. 25 000 (3) රු. 27 000 (4) රු. 30 000

38. පහත සඳහන් ගනුදෙනු අතරින් පොදු ජ'නලයේ සඳහන් වන ගනුදෙනුව වන්නේ,

(1) අශෝක හාඩ්වෙයාර් එකක් රු. 900 බැගින් සිමෙන්ති මලු 1 000ක් ණයට විකිණීම
(2) ශාන්ති ඉදිකිරීම් සමාගම රුපියල් ලක්ෂ 20කට කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රයක් ණයට ගැනීම
(3) තරුෂ දේපළ සමාගම විසින් සෙත් සරණ ළමා නිවාසයට රු. 10 000ක මුදලක් පරිත්‍යාග කිරීම
(4) හසරැලි පොත් වෙළෙඳ සලේ ප්‍රධාන මුදල් භාරකරු, සුළු මුදල් භාරකරුට රු. 720ක් ලබාදෙමින් අග්‍රිමය ප්‍රතිපූරණය කිරීම.

39. පහත ගිණුම්කරණ වැරදි වලින් ශේෂ පිරික්සුමේ සමානත්වයට බලපාන වරද වන්නේ,

(1) රු. 3 000ක ගැනුම් ඉන්වොයිසියක් පිළිබඳව ගිණුම් පොත්වල කිසිදු සටහනක් නොතිබීම.
(2) ගොඩනැගිලි අලුත්වැඩියාව වෙනුවෙන් ගෙවූ රු. 7 500ක් ගොඩනැගිලි ගිණුමට හර කර තිබීම.
(3) රු. 500ක අත්පිට විකුණුමක්, විකුණුම් ගිණුමේ හර පැත්තේ සටහන් වීම.
(4) ණයගැතියෙකු වූ අමල් ගෙන් ලැබුණු රු. 2 000, ණයගැති විමල්ගේ ගිනුමේ බැර පැත්තේ සටහන් වීම.

40. ලහිරු ආයතනයට ඉසුරුගෙන් ලැබුණු රු. 5 000ක් මුදල් පොතේ නිවැරදිව සටහන් කොට තිබුණ ද, ඉසුරුගේ ගිණුමේ වැරදි පැත්තේ සටහන් කොට තිබිණි. මෙම වරද නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන වන්නේ,

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) | ඉසුරු ගේ ගිණුම | හර | රු.5 000 | (2) | අවිනිශ්චිත ගිණුම | හර | රු.5 000 |
| | මුදල් ගිණුම | බැර | රු.5 000 | | ඉසුරු ගේ ගිණුම | බැර | රු.5 000 |
| (3) | ඉසුරු ගේ ගිණුම | හර | රු.10 000 | (4) | අවිනිශ්චිත ගිණුම | හර | රු.10 000 |
| | අවිනිශ්චිත ගිණුම | බැර | රු.10 000 | | ඉසුරු ගේ ගිණුම | බැර | රු.10 000 |

* *

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - II

- **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න **02**ක් ද, II කොටසෙන් ප්‍රශ්න **02**ක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න **05**කට පමණක් පිළිතුරු සපයන්න.

1. පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක (i) සිට (x) දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ආහාර තාක්ෂණවේදය පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා සිටි කාන්ති, දිගු කලක සිට ම ව්‍යාපාරයක් ඇරඹීමේ අදහසින් පසු වූවාය. ඇය ජීවත් වන ප්‍රදේශයේ මෑතකදී ජාතික පාසලක් අලුතින් ඇරඹීය. ගමනාගමන දුෂ්කරතා පැවැතීමත්, පාසල තුළ ආපන ශාලාවක් නොමැති වීමත් නිසා 2020.01.01දින තමා සතු රු. 200 000ක මුදල ද රු. 300 000ක් වටිනා ත්‍රිරෝද රථය ද යොදා 'රස පියස' නමින් ආපන ශාලාවක් පාසල අසල පිහිටුවන ලදී. එදිනම රු. 100 000ක ණය මුදලක් ලංකා බැංකුවෙන් ලබාගෙන ඇත. ව්‍යාපාරයේ කටයුතු සඳහා සහායකයකු බඳවා ගන්නා ලදී.

ප්‍රදේශයේ සුළු පරිමාණ ගෘහස්ථ ආහාර නිෂ්පාදකයන් ගෙන් මෙන්ම බේකරි හිමියන් ගෙන් ද අවශ්‍ය ආහාර තොග, අත්පිට මුදලට මෙන් ම ණයට ද ලබා ගත්තා ය. අත්පිට මුදලට පමණක් ආහාර අලෙවි කරන ලදී.

2020 ජනවාරි මාසයේ සිදුවූ ගනුදෙනු පහත සඳහන් වේ.

| | | |
|---|---|---|
| ව්‍යාපාරයට අවශ්‍ය උපකරණ මිලට ගැනීම .............. | රු. | 30 000 |
| ආහාර මිලට ගැනීම .............. | රු. | 15 000 |
| ණයට ගැනුම් .............. | රු. | 10 000 |
| ගෑස් මිලට ගැනීම .............. | රු. | 3 000 |
| මාසික කඩ කුලී ගෙවීම .............. | රු. | 5 000 |
| සේවක වැටුප් ගෙව්වා .............. | රු. | 8 000 |
| ත්‍රී රෝද රථ නඩත්තු වියදම් .............. | රු. | 6 000 |
| ගෙවූ අනෙකුත් වියදම් .............. | රු. | 2 000 |
| මාසයේ මුළු විකුණුම් .............. | රු. | 100 000 |

(i) (අ) 'රස පියස', නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වරූපය අනුව කුමන ව්‍යාපාර වර්ගයකට අයත් ද?
(ආ) මෙම ව්‍යාපාරයෙන් ඉටුවන මිනිස් අවශ්‍යතාවය හා එයට අදාළ වුවමනා **දෙකක්** නම් කරන්න.

(ii) (අ) මෙම ව්‍යාපාරය කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් ද?
(ආ) මෙම ව්‍යාපාර නාමය ලියා පදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.

(iii) (අ) මෙම සිද්ධියට අදාළව තොග වෙළඳාමක් සිදු වන අවස්ථාවක් දක්වන්න.
(ආ) මෙම ව්‍යාපාරයට සහායකයකු බඳවා ගැනීම කළමනාකරණ ක්‍රියාවලියේ කුමන කාර්යයට අයත් ද?

(iv) මෙම සිද්ධියේ සඳහන් ව්‍යාපාර ආයතන **දෙකක්** නම් කර, ඒවා අරමුණ අනුව වර්ග කිරීමේ දී, කුමන ව්‍යාපාර සංවිධාන වර්ගයකට අයත් දැයි වෙන වෙන ම දක්වන්න.

(v) 2020.01.01 දිනයට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සමග ලියා දක්වන්න.

(vi) (අ) මෙම ව්‍යාපාරයේ ආරම්භක ප්‍රාග්ධනය කොපමණ ද?

(ආ) 2020 ජනවාරි 31වන දිනට ව්‍යාපාරය සතු ජංගම නොවන වත්කම්වල වටිනාකම ගණනය කරන්න.

(vii) මෙම සිද්ධියට අදාළ ගනුදෙනු සටහන් කිරීමට යොදාගන්නා මූලික සටහන් පොත් **දෙකක්** හා ඒවාට අදාළ වන මූලාශ්‍ර ලේඛනය බැගින් ලියන්න.

(viii) රු. 30 000ක උපකරණ මිලට ගැනීම, ගිණුම් ගත කිරීමට අදාළ ද්විත්ව සටහන අගයන් සමග ලියා දක්වන්න.

(ix) 2020.01.31දිනට 'රස පියස' ව්‍යාපාරයෙහි අත ඉතිරි මුදල ගණනය කරන්න.

(x) ව්‍යාපාරයේ ගැනුම් ජ'නලය පිළියෙල කර අදාළ ලෙජර් ගිණුම්වලට පිටපත් කර පෙන්වන්න.

(ලකුණු 02×10 = 20 යි)

**I කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න)

2. (i) (අ) **ව්‍යාපාරයක්** යනු කුමක් ද?

(ආ) මිනිස් අවශ්‍යතා හා වුවමනා අතර වෙනස්කම් **දෙකක්** ලියන්න.

(ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) විද්‍යුත් මාධ්‍ය මගින් අද මුළු ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත.

(ආ) ඇල්මැති පාර්ශව වන සැපයුම්කරුවන් ගේ අරමුණ සාධාරණ වැටුප් ලබා ගැනීම ය.

(ඉ) ඉන්ධන මිල ඉහළ යාම ආර්ථික පරිසරයට අයත් ය.

(ඊ) සිල්ලර වෙළඳ ආයතන, සේවා සපයන ව්‍යාපාර ය.

(ලකුණු 02 යි)

(iii) කරුණාදාස, කෙසෙල් වගා කරුවන් ගෙන් කෙසෙල් කොළ මිලදීගෙන ඒවා භාවිතයෙන් නව ආහාර දවටන නිපදවා ඇත. ඔහු තම නිෂ්පාදිත ආපන ශාලාවලට අලෙවි කෙරේ.

(අ) කරුණාදාසගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්විය හැකි පාර්ශ්ව **දෙකක්** නම් කරන්න.

(ආ) එම පාර්ශ්වයන් කරුණාදාසගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට බලපාන හේතුවක් බැගින් ලියන්න.

(ලකුණු 02 යි)

(iv) ප්‍රදේශයේ රැකියාවල නියුතු කාන්තා පිරිස වැඩි වීමත් සමග ම කාන්තා නිමි ඇඳුම්වලට ඇති ඉල්ලුම ද වැඩි වෙමින් පවතී. දක්ෂ පළපුරුදු ඇඳුම් මසන්නියකගේ සහාය ඇතිව උසස් තත්වයේ නිමි ඇඳුම් ඉදිරිපත් කිරීම නිසා නිල්මිණිගේ නිමි ඇඳුම් ව්‍යාපාරය කාන්තාවන් අතර වඩාත් ජනප්‍රිය වී ඇත.

නිල්මිණිගේ ව්‍යාපාරයේ,

(අ) ශක්තියක්

(ආ) අවස්ථාවක් ලියන්න.

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

3. (i) (අ) **චෙක්පතක්** යනු කුමක් ද?

(ආ) චෙක්පත් රේඛනය කළ හැකි ආකාර **දෙක** ලියන්න.

(ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් හානිපූර්ණ මූලධර්මය බලපායි.

(ආ) සන්නිවේදන ක්‍රියාවලියේ දී, පණිවුඩය ලබන්නා පණිවුඩය සම්බන්ධයෙන් ක්‍රියාකරන ආකාරය ප්‍රතිපෝෂණය යි.

(ඉ) තම දියණියගේ මංගල උත්සවය සඳහා වෙළෙඳසලකින් සහල් කිලෝ 100ක් මිලදී ගැනීම සිල්ලර වෙළෙඳාමකි.

(ඊ) ප්‍රවාහන මාධ්‍යය හැසිරවීම සඳහා භාවිතයට ගන්නා ස්ථානය, පර්යන්තය වේ.

(ලකුණු 02 යි)

(iii) අමල්, කමල් සහ විමල් මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ විවිධ දක්ෂතා ඇති තිදෙනෙකි. මොවුන් තිදෙනා එකතුව, ලාභ අරමුණු කරගත්, වගකීම සීමිත, අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාර සංවිධානයක් ආරම්භ කිරීමට අදහස් කරගෙන සිටිති.

(අ) ඉහත මිතුරන් තිදෙනා සඳහා ඔබ යෝජනා කරන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?

(ආ) ඉහත **(අ)** යටතේ දැක්වූ ව්‍යාපාර සංවිධාන වර්ගයේ දැකිය හැකි **වාසියක්** හා **අවාසියක්** ලියන්න.

(ලකුණු 02 යි)

(iv) හෂීම් තම ව්‍යාපාරයට රු. 52 000ක භාණ්ඩ තොගයක් මහේෂ් ගෙන් මිල දී ගෙන ඒ සඳහා රු. 2 000ක් මුදලින් ගෙවා ඉතිරි මුදල සඳහා ලංකා බැංකුවේ ඇති තම ජංගම ගිණුමට අදාළ චෙක්පතකින් ගෙවන ලදි.

(අ) ඉහත සඳහන් චෙක්පතට සම්බන්ධ අණකරු හා අණලදු නම් කරන්න.

(ආ) චෙක්පතේ සඳහන් කළ වටිනාකම කොපමණද?

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

4. (i) (අ) කළමනාකරණ ක්‍රියාවලියට අයත් කාර්යයන් දක්වන්න.

(ආ) **අලෙවිකරණය** යනු කුමක් ද?

(ලකුණු 02 යි)

(ii) පහත ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න සඳහන් කරන්න.

(අ) ගැනුම්කරු හා විකුණුම්කරු හමුවන හෝ සම්බන්ධවන ඕනෑ ම ආකාරයක් වෙළෙඳපොළකි.

(ආ) කළමනාකරු තම සේවකයන්ට අවශ්‍ය තොරතුරු හා උපදෙස් සැපයීම, 'පාලනය' යි.

(ඉ) අලෙවිකරණ මිශ්‍රයට අයත් මිල, පාරිභෝගිකයන්ට මෙන් ම ව්‍යාපාරිකයන්ට ද වැදගත් විචල්‍යකි.

(ඊ) නිෂ්පාදිත බෙදාහැරීමේ දී නිෂ්පාදකයා මෙන් ම තොග වෙළෙන්දා ද, අතරමැදියන් ලෙස ක්‍රියා කරයි.

(ලකුණු 02 යි)

(iii) පානීය ජල බෝතල් නිෂ්පාදන ආයතනයක් විසින් අනුගමනය කළ පියවර කිහිපයක් පහත දැක්වේ.

- යන්ත්‍ර ක්‍රියාකරුවන් බඳවා ගැනීම.
- යන්ත්‍ර ක්‍රියාකරුවන් ට අවශ්‍ය උපදෙස් හා තොරතුරු ලබා දීම.
- පානීය ජල බෝතලයේ හැඩය තීරණය කිරීම
- නිෂ්පාදිත පානීය ජල බෝතල් ප්‍රමිතියට අනුකූල දැයි පරීක්ෂා කිරීම.

ඉහත පියවර කළමනාකරණ ක්‍රියාවලියට අයත් එක් එක් කාර්යයන් යටතේ නම් කරන්න.

(ලකුණු 02 යි)

(iv) බලදේව ස්වයං රැකියාවක් ලෙස සිමෙන්ති ගල් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර පවත්වා ගෙන යයි. තමන් නිෂ්පාදනය කරන සිමෙන්ති ගල්, පාවිච්චි කරන්නන් වෙත බෙදාහැරීම තමා විසින් ම සිදු කරනු ලබයි.

(අ) බලදේව විසින් නිෂ්පාදනය කරන සිමෙන්ති ගල් අයත් වන්නේ අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍ය යටතට ද?

(ආ) බලදේව සිමෙන්ති ගල් බෙදාහැරීම සඳහා යොදා ගන්නා ක්‍රමය හඳුන්වන්නේ කුමන නමකින් ද?

(ලකුණු 02 යි)

**(මුළු ලකුණු 08 යි)**

**II කොටස - ගිණුම්කරණය**

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

5. (i) (අ) ගිණුම්කරණය කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව 2ක් ලියන්න.

(ආ) වත්කමක හා වගකීමක දක්නට ලැබෙන **සමාන** ලක්ෂණය කුමක් ද?

(ලකුණු 02 යි)

(ii) සජිත්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ මුල් සතියේ සිදුවූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

1. රු. 50 000ක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යෙදවීම
2. රු. 10 000ක් පිරිවැය වූ භාණ්ඩ ණයට ගැනීම
3. රු. 2 000ක භාණ්ඩ තොගයක් රු. 3 000කට අත්පිට මුදලට විකිණීම
4. රු. 4 000ක විදුලි ගාස්තු ගෙවීම

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය දැක්වීම
(පිළිතුරු සැපයීම සඳහා පහත ආකාරයේ වගුවක් භාවිතා කරන්න.)

| ගනුදෙනුව | වත්කම් (රු.) | | = හිමිකම් (රු.) | + වගකීම් (රු.) |
|---|---|---|---|---|
| | බඩු තොගය | + මුදල් | හිමිකම | + ණය හිමියෝ |
| 1 | | | | |
| 2 | | | | |
| 3 | | | | |
| 4 | | | | |

(ආ) ඉහත ගනුදෙනුවලට පසු 2020.01.07 දිනට ව්‍යාපාරයේ පහත අයිතම්වල ශේෂ දැක්වීම.

(1) මුදල් (2) හිමිකම

(ලකුණු 06 යි)

(iii) නිසල්ගේ ව්‍යාපාරයේ 2020 ජනවාරි මාසයේ මුදල් ගනුදෙනු පහත වගුවේ දැක්වේ. 2020.01.01දිනට මුදල් ශේෂය රු. 10 000ක් විය.

| දිනය | ලදුපත් අංක | වවුචර් අංක | විස්තරය | වටිනාකම රු. |
|---|---|---|---|---|
| 2020.01.02 | 01 | | බැංකු ණයක් ගැනීම | 15 000 |
| 2020.01.05 | | 01 | අත්පිට ගැනුම් | 7 000 |
| 2020.01.10 | 02 | | අත්පිට විකුණුම් | 3 000 |
| 2020.01.15 | | 02 | විදුලි ගාස්තු ගෙවීම | 2 000 |
| 2020.01.20 | 03 | | ණයගැතියන් ගෙන් මුදල් ලැබීම | 1 000 |

අවශ්‍ය වන්නේ :

ඉහත ගනුදෙනු නිසල්ගේ ව්‍යාපාරයේ මුදල් පොතේ සටහන් කර 2020.01.31 දිනට මුදල් පොත තුලනය කිරීම

(ලකුණු 04 යි)

**(මුළු ලකුණු 12 යි)**

6. (i) (අ) **සුළු මුදල් අග්‍රිමය** යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 01 යි)

(ii) ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු දෙකකට අදාළ ද්විත්ව සටහන පහත දැක්වේ.

(අ) ණයගැති ගිණුම හර රු. 6 000
විකුණුම් ගිණුම බැර රු. 6 000

(ආ) ණය හිමි ගිණුම හර රු. 9 000
මුදල් ගිණුම බැර රු. 8 500
ලද වට්ටම් ගිණුම බැර රු. 500

ඉහත සිදු වී ඇති එක් එක් ගනුදෙනුව ලියන්න.

(ලකුණු 01 යි)

(iii) රත්නසිරිගේ ව්‍යාපාරයේ 2020 මාර්තු මාසය තුළ සිදු වූ සුළු වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| දිනය | විස්තරය | මුදල (රු.) |
|---|---|---|
| 2020.03.01 | අග්‍රිමය ලැබුණා | 3 000 |
| 2020.03.02 | ලිපි ද්‍රව්‍ය වියදම් | 150 |
| 2020.03.06 | ගමන් වියදම් | 200 |
| 2020.03.09 | කාර්යාල උපකරණ ගැනීම | 500 |
| 2020.03.11 | සංග්‍රහ වියදම් | 130 |
| 2020.03.14 | කුලී රථ ගාස්තු | 180 |
| 2020.03.18 | ගෙන ඒමේ කුලී | 160 |
| 2020.03.21 | කම්කරු කුලී | 200 |

| | | |
|---|---|---|
| 2020.03.23 | පෑන්, පැන්සල් | 210 |
| 2020.03.25 | සංග්‍රහ වියදම් | 170 |
| 2020.03.25 | පිරිසිදු කිරීමේ වියදම් | 220 |
| 2020.04.01 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා | |

අවශ්‍ය වන්නේ :

ලිපි ද්‍රව්‍ය වියදම්, ගමන් වියදම්, සංග්‍රහ වියදම් හා විවිධ වියදම් යන සුළු වියදම් විශ්ලේෂණ තීරු සහිත සුළු මුදල් පොත.

(ලකුණු 05 යි)

(iv) වික්‍රමගේ ව්‍යාපාරයෙහි 2020 ජූනි මාසයට අදාළ තොරතුරු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිස් අංක | ගැනුම්කරු | ශුද්ධ වටිනාකම රු. |
|---|---|---|---|
| 2020.06.02 | 610 | කුසල් | 13 500 |
| 2020.06.07 | 611 | විසල් | 8 200 |
| 2020.06.18 | 612 | නයෝමි | 5 300 |
| 2020.06.28 | 613 | මියුරි | 9 250 |

අවශ්‍ය වන්නේ :

(අ) විකුණුම් ජ'නලය
(ආ) ලෙජරයේ අදාළ ගිණුම්

(ලකුණු 05 යි)
**(මුළු ලකුණු 12 යි)**

7. (i) (අ) **බැංකු අයිරාව** යනු කුමක් ද?
(ආ) පොදු ජ'නලයේ ඇතුළත් කරන සටහන් වර්ග 02ක් ලියන්න.

(ලකුණු 02 යි)

(ii) 2020 ජනවාරි 31 දිනට කීර්තිගේ ව්‍යාපාරයේ බැංකු ගිනුමේ ශේෂය රු. 30 000ක් විය. එහෙත් එදිනට බැංකු ප්‍රකාශයේ සඳහන් ශේෂය එයට වෙනස් විය. වෙනසට හේතු වශයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය.

- තැන්පත් කළ නමුත් නිශ්කාශනය නොවූ චෙක්පත් රු. 5 000ක් විය.
- බැංකුව වෙත සෘජුවම ණයගැතියන් ප්‍රේෂණය කර තිබූ මුදල රු. 3 000කි.
- රු. 600ක බැංකු ගාස්තුවක් බැංකුව අයකර ගෙන තිබිණි.
- නිකුත් කළ නමුත් මෙතෙක් බැංකුවට ඉදිරිපත් කර නැති චෙක් පත් රු. 7 000කි.
- ස්ථාවර නියෝග මත රක්ෂණ වාරික රු. 2 000ක් බැංකුව ගෙවා ඇත.

අවශ්‍ය වන්නේ :

(අ) බැංකු ගිනුමේ ශේෂය සංශෝධනය කිරීම.
(ආ) 2020.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කර, එදිනට බැංකු ප්‍රකාශයේ පැවති ශේෂය පෙන්නුම් කිරීම.

(ලකුණු 04 යි)

(iii) 2020.03.31 දිනට රවිඳුගේ ව්‍යාපාරයේ ශේෂ පිරික්සුමේ බැර එකතුවට වඩා හර එකතුව රු. 28 000ක් අඩුවෙන් දක්වා තිබිණි. පසුව පහත සඳහන් වැරදි සොයා ගන්නා ලදී.

1. රු. 5 000ක ගැනුම් ඉන්වොයිසිය පොත් වලින් මග හැරී ඇත.
2. විකුණුම් ජ'නලයේ එකතුව රු. 12 000ක් වැඩියෙන් සටහන් වීම.
3. ගෙවූ ප්‍රවාහන වියදම එම ගිණුමට රු. 16 000ක් අඩුවෙන් සටහන් කර තිබීම.
4. අමල්ට ගෙවූ රු. 9 000ක් විමල්ගේ ගිණුමේ හර පැත්තේ සටහන් කිරීම.

අවශ්‍ය වන්නේ:

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්
(ආ) අවිනිශ්චිත ගිණුම පියවීම

(ලකුණු 06 යි)
**(මුළු ලකුණු 12 යි)**

***